# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1923/38 - 2015 ජූලි මස 15 වැනි බදාදා - 2015.07.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම්

ව්‍යාස්ථාපිත නිශ්චය අංකය :- 4636
විශේෂ අංකය :- මහ/578

### 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්චය

මහනුවර, රජපිහිල්ල මාවත, අංක 74 දරන ස්ථානයෙහි පදිංචි දුනුවිල ශ්‍රියාණි සුජාතා රණසිංහ මහත්මිය විසින් පනතේ 18 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත ප්‍රකාශනයක් කරන ලදින්, පනතේ 19 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව, එම කොමිෂන් සභාව විසින් ව්‍යවස්ථාපිත බදු ගැණුම්කාරියට අයිතියව තිබූ කෘෂිකාර්මික ඉඩම් වලින් ඇයට තබා ගැනීමට ඉඩදිය යුතු කොටස නිශ්චය කරමින් ව්‍යවස්ථාපිත නිශ්චයක් කරන ලදී. එසේ ව්‍යවස්ථාපිත බදු ගැණුම්කාරියට තබා ගැනීමට ඉඩදෙන ලද කෘෂිකාර්මික ඉඩම් කොටස් මෙහි පහත උපලේඛනයෙහි දක් වේ.

ටී. ඒ. සුමනතිස්ස තාඹුගල,
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2015 ජූලි මස 09 වැනි දින,
කොළඹ 07,
හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ අංක සී 82 හි,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

1. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ අස්ගිරි පල්ලේසිය පත්තුව, සුළු කොට්ඨාසයේ, ඉඩංගම යන ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද මූලික පිඹුරු අංක මා 301හි දක්වෙන සිල්වහිල් වත්ත, උඩස්ගිරිය වත්ත නමැති ඉඩමේ කැබලි අංක 01 දරන බිම් කැබැල්ලෙන් නොබෙදූ අක්කර 42, රූඩ් 0, පර්චස් 00.7ක් වන බිම් කොටස සහ එහි තුළ පිහිටි ගහකොල, පළතුරු හා ගොඩනැගිලි ද වේ.

1A - G 21921 — 16 (2015/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, සිංහලපත්තුව ප්‍රාදේශීය ආදයම් නිලධාරී කොට්ඨාසයේ, ගිරිතල යන ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන හූ ලක්ෂණාත්මක පිඹුරු අංක 09හි අතිරේක අංක 08හි දැක්වෙන පරණ කුඹුරුයාය නමැති ඉඩමේ කැබලි අංක 2644 දරන බිම් කැබැල්ලෙන් නොබෙදූ අක්කර 00, රූඩ් 01, පර්චස් 08ක් වන බිම් කොටස වේ.

3. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ආදයම් නිලධාරී කොට්ඨාසයේ, කුළුගම්මනසිය පත්තුව සුළු කොට්ඨාසයේ, බරිගම යන ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද මූලික පිඹුරු අංක මහ 2990හි දැක්වෙන යහලතැන්න වත්ත නමැති ඉඩමේ කැබලි අංක 01 දරන බිම් කැබැල්ලෙන් නොබෙදූ අක්කර 07, රූඩ් 1, පර්චස් 07ක් වන බිම් කොටස සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු හා ගොඩනැගිලි ද වේ.

07-1391

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.